*සැ. යු.*- (i) 2016.08.19 දින පළ වූ අංක 1,981 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවී ය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2016 වර්ෂය සඳහා කුරුණෑගල සහ කුලියාපිටිය අධිකරණ කලාපවලට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන්ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,982 - 2016 අගෝස්තු මස 26 වැනි සිකුරාදා - 2016.08.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1508 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත, 2016 ජූනි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 සැප්තැම්බර් මස 15 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 සැප්තැම්බර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2016 ජූනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1507 - B 81092 — 5,403 (2016/08)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාගය - 2016

මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරේ පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පොදු සුදුසුකම් :

1.1. *විවෘත බඳවා ගැනීම් :*

1.1.1. අයදුම්කරු ශ්‍රී ලාංකික විය යුතු ය.
1.1.2. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
1.1.3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2016.09.22) පූර්වාසන්නයෙන් වූ වසර 03 ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
1.1.4. සෑම අයදුම්කරුවෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
1.1.5. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

1.2. *සීමිත බඳවා ගැනීම් :*

1.2.1. ඉහත 1.1.1 සිට 1.1.4 දක්වා සුදුසුකම් එලෙසින්ම අදාළ වේ.
1.2.2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු ය. උපරිම වයස් සීමාව අදාළ නොවේ.

2. අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

මෙහි දැක්වෙන සියලු සුදුසුකම් 2016.09.22 දිනට සම්පූර්ණකර තිබිය යුතු ය.

| *ධාරාව* | *අධ්‍යාපන සුදුසුකම්* | *පළපුරුද්ද* |
|---|---|---|
| විවෘත බඳවා ගැනීම් | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. (එය ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ එම විෂයයන් උපාධියේ විෂයයක් ලෙස හදාරා තිබිය යුතුය.) | අදාළ නොවේ. |
| සීමිත බඳවා ගැනීම් | ඉහත පරිදි වේ. | මධ්‍යම පළාත් රාජ්‍ය සේවයෙහි ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක අවම වශයෙන් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය. |

3. *වැටුප් පරිමාණය.-* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි MN - 4 - 2016 අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 31,490 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 = රු. 54,250

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි 2016.01.01 දිනට වැටුප රු. 18,470/-කි. මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන පරිදි ඉදිරි වැටුප් ගෙවීම් සිදු කරනු ලැබේ.)

4. *බඳවා ගැනීමේ කොන්දේසි.-* මෙම තනතුරට අදාළව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගැනීමේ කොන්දේසි තීරණය වේ.

5. *බඳවා ගැනීමේ ක්‍රමය.-* පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70%ක් විවෘත බඳවා ගැනීම් යටතේ ද, 30%ක් සීමිත බඳවා ගැනීම් යටතේ ද සිදු කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාතය අනුව සිදු කරනු ලැබේ. සියලු බඳවා ගැනීම් සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකදී ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවය මත සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර ලිඛිත පරීක්ෂණයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා අයැදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සලකා බලනු නොලැබේ.

6. *සේවා කොන්දේසි.-*

6.1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

6.2. අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අදාළ අනෙකුත් චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන්ට යටත් වේ.

6.3. මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05 ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර, එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට කරනු ලබන කිසිඳු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

7. *අයැදුම් කිරීමේ ක්‍රමය.-*

7.1. විභාග ගාස්තුව රු.600/කි. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන පරිදි මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ඒ සඳහා ලබා ගත් ලදුපතක් අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එකී ලදුපත නොමැතිව එවන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

7.2. අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට 2016.09.22 දිනට පෙර ලැබෙන සේ ''ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර. මහනුවර'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීම - 2016" සහ පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අස්ථානගතවන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වගකියනු නොලැබේ.

8. *විභාග මාධ්‍යය.-* විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අක්ෂරය පැහැදිලිව සඳහන් කළ යුතු අතර, එය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. *විභාග මධ්‍යස්ථානය.-* විභාග මධ්‍යස්ථානය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ.

10. *ලිඛිත විභාගය හා විෂය නිර්දේශය.-* විවෘත හා සීමිත යන දෙපාර්ශවයේම අයදුම්කරුවන් මෙම තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් විෂයයන් හා විෂය නිර්දේශයන් යටතේ ලිඛිත විභාගයකට යොමු කරනු ලැබේ.

10.1. අභියෝග්‍යතාවය හා බුද්ධි පරීක්ෂණය - (කාලය පැය 01 යි) (ලකුණු 100 යි)
භාෂා හැකියාව,ගණිතමය කුසලතාවය, සහ තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කර බැලීම සඳහා කෙටි හා බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

10.2. සාමාන්‍ය දැනීම හා විෂයානුබද්ධ දැනීම - (කාලය පැය 02 යි) (ලකුණු 100යි )
මෙම ප්‍රශ්න පත්‍රයට ග්‍රාම සංවර්ධන විෂය ක්ෂේත්‍රයට අදාළ වන කරුණු සහ කාලීන සමාජ හා දේශපාලන තොරතුරු ආශ්‍රය කරගෙන සකස් කරනු ලබන ප්‍රශ්න ඇතුළත් වේ.

11. *අයැදුම්පත් පිරවීම සඳහා උපදෙස්.-* ආදර්ශ අයැදුම්පත් ආකෘතියට ප්‍රකාර ඒ 4 ප්‍රමාණයක කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-5 දක්වා කරුණු ද, අනෙක් පිටුවල ඉතිරි ඡේද ද ඇතුළත්වන සේ සකස් කර ගත යුතුය. අයැදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය. අයැදුම්පත්‍රය පිරවීමේදී පහත දැක්වෙන සංකේත අංක නියමිත කොටුවල පැහැදිලිව සඳහන් කළ යුතු ය.

11.1. අයදුම් කරන දිස්ත්‍රික්කය ලෙස සඳහන් කල යුත්තේ අයැදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකයයි.

| | | |
|---|---|---|
| මහනුවර | - | 01 |
| මාතලේ | - | 02 |
| නුවරඑළිය | - | 03 |

11.2. අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රු 2,40,360/- කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිළධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.3. යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

11.4. රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

12. මෙම විභාග පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

2016 අගෝස්තු මස 11 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

ආර්. එම්. එන්. රත්නායක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

**ආදර්ශ අයැදුම්පත්‍රය**

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2016**

විභාග අංකය : [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- [ ] (සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E)
(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න.)

ධාරාව : [ ] (විවෘත - 01, සීමිත - 02) (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

පදිංචි දිස්ත්‍රික්කය :- [ ] දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකය : [ ]

01. 1.1 මුලකුරු සමග නම : ..............................................................................................................
Mr./Mrs./Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 මුලකුරු සමග නම : ..............................................................................................................
මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :........................................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්/දෙමළෙන්) :........................................................................................

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :........................................................................................

2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :........................................................................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :........................................................................................

2.4 දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් කාර්යාලයීය ලිපිනය :........................................................................................

2.5 දුරකථන අංකය :........................................................................................

03. 3.1 උපන් දිනය : ........................................................................

3.2 අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2016.09.22) වයස : අවුරුදු :.............. මාස :............. දින :...............

3.3 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

04. ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................

05. 5.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :...................................................................

| *ඡන්ද හිමි නාමලේඛනයට අනුව පදිංචිය* | *2013* | *2014* | *2015* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාශය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාශය | | | |
| ග්‍රාම නිලධාරී කොට්ඨාශ අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

06. අධ්‍යාපන සුදුසුකම් :

| *විශ්ව විද්‍යාලය* | *ලබා ඇති උපාධිය* | *උපාධියට හදාරා ඇති විෂයයන්* | *සහතිකපත් අංකය හා උපාධිය වලංගු දිනය* |
|---|---|---|---|
| | | | |

07. පළපුරුද්ද (සීමිත ධාරාව යටතේ ඉල්ලුම් කරනු ලබන අයැදුම්කරුවන් සඳහා පමණි) :

7.1 ඔබ දැනට සේවයේ නියුතු ආයතනයේ නම :........................................................................................

7.2 එම ආයතනය අයත් දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශය :........................................................................................

7.3 දැනට දරන තනතුරේ පදවි නාමය :..................................................................................................................

7.4 එම තනතුරට පත් වූ දිනය :..................................................................................................................

7.5 එම තනතුරේ ස්ථිර කළ දිනය :..................................................................................................................

7.6 එම තනතුරේ 2016.09.22 දිනට සේවා කාලය : අවු : ........................... මාස :........................... දින :...........................

7.7. දැනට දරන තනතුර විශ්‍රාම වැටුප් සහිත ද යන වග :..................................................................

08. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :

i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම : .......................................................

ii. දිනය : ...........................................................................

iii. කුවිතාන්සි අංකය : ............................................................................

(මුදල් ගෙවා ලබාගත් ලදුපත මෙම තීරුව අසලින් අලවන්න.)

**අයදුම්කරුගේ ප්‍රකාශය**

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි.

.................................... .............................................

දිනය අයදුම්කරුගේ අත්සන.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

දිනය :................................ .....................................................

සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :...........................................................................................

තනතුර :...........................................................................................

ලිපිනය :...........................................................................................

10. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතු ය.

මෙම ඉල්ලුම්කරු වන ............................................................................................................. මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ......................................................................... වශයෙන් සේවය කරයි. පසුගිය වසර 05 තුළ ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

දිනය :.................................. .....................................................................................

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

(නිල මුද්‍රාව සහිතව)

08-785

**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණිය/සංවර්ධන නිලධාරි (නීති) III ශ්‍රේණිය/සංවර්ධන නිලධාරි (තොරතුරු තාක්ෂණය) III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2016

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් බස්නාහිර පළාතේ අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

* බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුර
* බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි (නීති) III ශ්‍රේණියේ තනතුර
* බස්නාහිර පළාත් කෘෂිකර්ම හා පරිසර අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරි (තොරතුරු තාක්ෂණ) III ශ්‍රේණියේ තනතුර

02. අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2016.09.15 දින වේ. අයදුම්කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් 2016.09.15 දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

03. *පොදු සුදුසුකම් :*

*(අ)* ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
*(ආ)* යහපත් චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
*(ඇ)* අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක අඛණ්ඩ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

04. *සේවා කොන්දේසි.-* මෙම තනතුර ස්ථිරය. අනුමත සේවා ව්‍යවස්ථාව/රජය විසින් පනවනු ලබන සේවා කොන්දේසිවලට යටත් වේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.-* පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති විට, ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතා අනුපිලිවෙල මත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව බඳවා ගනු ලැබේ.

06. ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුර

6.1 *අධ්‍යාපන සුදුසුකම් :*
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබාතිබීම.

6.2 *වයස් සීමාව :*
වයස අවු 18 ට නොඅඩු හා අවු 35 ට නොවැඩි විය යුතු ය.

6.3 *වැටුප් පරිමාණය :*
රා. ප. ච. 06/2006 (iv) අනුව රු. 15,215 - 10 x 215 - 4 x 240 - 7 x 320 - 15 x 360 x 25,965 වේ. (MN4 - 2006A)

6.4 *ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය :*
මෙම තරග විභාගය විෂයයන් දෙකකින් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වන අතර සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතු වේ.

6.4.1 *අභියෝග්‍යතා පරීක්ෂණය.-* කාලය පැය 01 යි ලකුණු 100
අපේක්ෂකයාගේ භාෂා හැකියාව.- තර්කන හැකියාව, ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.

6.4.2 *සාමාන්‍ය දැනීම.-* කාලය පැය 01 යි ලකුණු 100
ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සමාජීය, සංස්කෘතික, විද්‍යාත්මක හා ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය හා විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

07. *සංවර්ධන නිලධාරි (නීති) III ශ්‍රේණියේ තනතුර*

7.1 *අධ්‍යාපන සුදුසුකම් :*
විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිවේදී උපාධියක් ලබා තිබීම.

7.2 *වයස් සීමාව :*
වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

7.3 *වැටුප් පරිමාණය :*
රා. ප.ච. 06/2006 (iv) අනුව රු.15,215 - 10 x 215 - 4 x 240 - 7 x 320 - 15 x 360 - රු. 25,965 (MN-4-2006A)

7.4 *ලිඛිත පරීක්ෂණයේ විෂයය නිර්දේශය :*
මෙම තරග විභාගය විෂයයන් තුනකින් සමන්විත ප්‍රශ්න පත්‍ර තුනකින් යුක්ත වන අතර සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතු වේ.

7.4.1 *අවබෝධය* - (කාලය පැය 1 1/2යි, ලකුණු 100)
අපේක්ෂකයාගේ අදහස් ප්‍රකාශනය, සාරාංශකරණය, අක්ෂර වින්‍යාසය, සරල වාක්‍ය, ව්‍යාකරණ භාවිතය පිළිබඳව දැනුම පරීක්ෂා කෙරේ.

7.4.2 *සාමාන්‍ය දැනීම* - (කාලය පැය 1 යි, ලකුණු 100)
දේශීය හා විදේශීය වශයෙන් වැදගත් වන කාලීන සිද්ධීන් පිළිබඳ දැනුම මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

7.4.3 *අභියෝග්‍යතාව* - (කාලය පැය 1 යි, ලකුණු 100)
අපේක්ෂකයාගේ තර්කානුකූල ශක්තිය, විශ්ලේෂණය හා සංස්ලේෂණ හැකියාව මැනෙන පරිදි සකස් වන ප්‍රශ්න පත්‍රයකි.

08. සංවර්ධන නිලධාරි (තොරතුරු තාක්ෂණය) III ශ්‍රේණියේ තනතුර

8.1 *අධ්‍යාපන සුදුසුකම් :*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් හෝ තොරතුරු තාක්ෂණ විෂයය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්වන උපාධියක් ලබා තිබීම.

8.2 *වෘත්තීය පළපුරුද්ද :*

පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණ විද්‍යාව විෂයයක් සහිතව උපාධියක් ලබාගැනීමෙන් අනතුරුව පරිගණක ක්ෂේත්‍රයේ අවු 02 ක වෘත්තීය පළපුරුද්දක් ලබාතිබීම (සහතික මගින් සනාථ කළ යුතු ය.)

8.3 *වයස් සීමාව :*

වයස අවුරුදු 24 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයවලුන් සඳහා මෙම උපරිම සීමාව බල නොපැවැත් වේ.

8.4 *වැටුප් පරිමාණය :*

රා. ප. ච. 60/2006 (iv) අනුව රු. 15,215- 10 x 215 - 4 x 240 - 7 x 320 - 15 x 360 - රු. 25,965 - (MN-4-2006A)

8.5 *ලිඛිත පරීක්ෂණයේ විෂයය නිර්දේශය*

මෙම තරග විභාගය විෂයයන් දෙකකින් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වන අතර සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතු වේ.

8.5.1 තොරතුරු සන්නිවේදන තාක්ෂණය - (කාලය පැය 02 යි, ලකුණු 100)

තොරතුරු තාක්ෂණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කරනු ලබන ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතු වේ. එයට ලිඛිත ප්‍රශ්න, මෙන්ම බහුවරණ ප්‍රශ්න ද අඩංගු වේ. මෙහෙයුම් පද්ධතීන්, මෘදුකාංග හා දෘඩාංග, වදන් සැකසුම්, පැතුරුම්පත්, දත්ත කළමනාකරණය - අන්තර්ජාලය හා ඉලෙක්ට්‍රොනික තැපැල ආදී ක්ෂේත්‍රවලින් විභාග අපේක්ෂකයා පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

8.5.2 අභියෝග්‍යතා පරීක්ෂණය - (කාලය පැය 01 යි, ලකුණු 100)

අයදුම්කරුගේ සංඛ්‍යා ලේඛණාත්මක හැකියාව, සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා සැකසූ ගණිතමය ගැටළු ඇතුළත් ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතු ය.

09. *අයදුම්කිරීමේ ක්‍රමය :*

9.1 එක් තනතුරක් සඳහා විභාග ගාස්තුව රු. 400 කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. (තනතුරු කිහිපයක් සඳහා අයදුම්කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර විභාග ගාස්තුව ද වෙන වෙනම ගෙවිය යුතු වේ.)

9.2 මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2016.09.15 දිනට හෝ ඊට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.) අංක 109, කෙලින් වීදිය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අදාළ තනතුරු නාමය අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතු ය. අයදුම්පත් ලද බව දන්වනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.3 මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය වන/නොවන කරුණු පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

වී. රාජපක්ෂ,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2016 අගෝස්තු මස 10 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුර/
සංවර්ධන නිලධාරි (නීති) III ශ්‍රේණියේ තනතුර/සංවර්ධන නිලධාරි (තොරතුරු තාක්ෂණය) III ශ්‍රේණියේ
තනතුරු සඳහා බඳවා ගැනීම - 2016

විභාග අංකය : ☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. (අ) මුලකුරු සමග නම :...........................................................................
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :.......................................................
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :................................................

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

02. නිවේදනය අනුව ඉල්ලුම් කරන තනතුරු නාමය : ☐

03. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල : ☐ දෙමළ : ☐
(අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න.)

04. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :...............................................................................................................

(i) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :...............................................................................................
(ii) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :.........................................................................................
(iii) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - (අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න.)

කොළඹ : ☐ ගම්පහ : ☐ කළුතර : ☐

(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2016.09.15 දිනට අදාල දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය :

වර්ෂ :——— මාස :——— දින :———

(v) දුරකථන අංකය :.........................................................................

05. උපන් දිනය : වර්ෂය :——— මාසය :——— දිනය :———.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2016.09.15 දිනට වයස : වර්ෂ :——— මාස :——— දින :———.

06. ස්ත්‍රී/පුරුෂ භාවය (අදළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

07. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

(i) ලබා ඇති උපාධිය :.....................................................................................................................
(ii) උපාධියේ දී හදාරන ලද ප්‍රධාන විෂයයන් :.......................................................................................
(iii) විශ්වවිද්‍යාලයේ නම :..................................................................................................................
(iv) උපාධිය සහතිකය වලංගු දිනය :.....................................................................................................
උපාධි සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය.)

**(සංවර්ධන නිලධාරී (තොරතුරු තාක්ෂණ) III ශ්‍රේණියේ තනතුර සඳහා අයදුම්කරන්නන් තොරතුරු තාක්ෂණ විෂය ප්‍රධාන විෂයයක් බව සනාථ කිරීමට අදාලව විෂය ලේඛනයේ පිටපතක් අමුණා එවිය යුතු ය.)**

07.1 **සංවර්ධන නිලධාරී (තොරතුරු තාක්ෂණ) III ශ්‍රේණියේ තනතුරට අයදුම්කරන්නන්ට අදාල වේ.**
වෘත්තීය පලපුරුද්ද (සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය.)

ආයතනය :..........................................................................................................................
කාල සීමාව : ............................................................ සිට ...................................................................... දක්වා

**(මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)**

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :.....................................................................
දිනය :....................................................................
ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :.....................................................................

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙනසේ අලවන්න. |
|---|

09. ........................................................................................................................................ වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

.................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**
(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ................................................ දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

.........................................
අත්සන.

සහතික කරන අයගේ නම :————.
තනතුර හා නිල මුද්‍රාව :————.

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සමාදාන විනිශ්වයකාරවරයෙකු දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුද්ධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 240,360 ට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතු යි.)

**රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**
(අනවශ්‍ය වචන කපා හරින්න)

..................................................................... මයා/මිය/මෙනවිය දැනට ............................................................................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .................................................................................. වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, ඔහු/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදිව බවත් සහතික කරන අතර මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය/ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

......................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :————.

08-741

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.